මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2015

---

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයට අදාළ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1)ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 පිහිටුවීම

---

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 1 දින සිට බලාත්මක වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සකස්කරන ලද 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ එහි අනුබද්ධ ආයතනයක් ලෙස මාතර

විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ සහ ඒ සමාන මට්ටම්වල තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම ප්‍රධාන අරමුණ වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

මාතර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 නොවැම්බර් 27 දින පවරා දී තිබුණු හෙක්ටයාර් 0.5854 ක ඉඩම සහ ආයතනය විසින් ඉදි කරනු ලැබූ ගොඩනැගිලි සංකීර්ණයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 751 | අධ්‍යයනාංශ 06 ක් සඳහා ලැබී තිබුණු පිරිවැය රු.139,607,232 ක් වූ භාණ්ඩ වර්ග 430 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | ආයතනයේ හෝ අධ්‍යයනාංශවල ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිරිවැය රු. 172,742,464 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් පරිදි වත්කම් පන්ති අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිරිවැය රු.8,667,275 ක් වූ පරිගණක, මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මෙහෙයුම් කටයුතු 2015 වර්ෂයේදී ආරම්භකර තිබූ අතර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,054,346 ක ඌණතාවයක් සිදු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත අනුව අරමුණු 07 ක් හඳුනාගෙන තිබුණි. ඒවා පහත සඳහන් පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැක.

(i) තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ වෘත්තීය වැඩසටහන් සඳහා ශිෂ්‍යයන්ගේ ප්‍රගති සංවර්ධනයට සහාය වීම, කර්මාන්තවල පුහුණුව ලබන තැනැත්තන් සඳහා අධ්‍යාපනික පුහුණුව ලබාදීම සහ පුහුණුව සඳහා විෂයමාලා ප්‍රවර්ධනය කිරීමෙහිලා සහාය වීම.

(ii) මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන් සඳහා සහ ජාතික වෘත්තීය ප්‍රවීණත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස සුදුසුකම් ලබා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම.

(iii) අඛණ්ඩ වෘත්තීය වැඩිදියුණුව පිළිබඳ වෘත්තීය පාඨමාලා සැපයීම.

(iv) ඉදිකිරීම්, නිෂ්පාදන සහ සේවා අංශ සම්බන්ධයෙන් ආයතනයන් ඇතුළුව මහජනතාව වෙත ව්‍යාප්ත සේවාවන් සැපයීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2014 නොවැම්බර් 20 දින ආයතනය ස්ථාපිත කර තිබුණද, 2016 ජුනි 15 දක්වාම ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු මොනවාද යන්න නිශ්චය කර නොතිබුණි.

(ආ) ආයතනයේ පාඨමාලා 07 ක් සඳහා ලියාපදිංචි වී තිබුණු සිසුන් 123 දෙනෙකුගෙන් 24 දෙනෙකු පාඨමාලා හැරයාමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ නමුත්, එම තත්ත්වය අවම කරගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස්කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි ආයතනයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ආයතනයේ විවිධ අංශ සඳහා පුහුණු සැළසුම් සකස් කර තිබුණද, ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැතිවීම මත ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) එක් එක් පාඨමාලාව සඳහා උපරිම වශයෙන් බඳවා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 30 ක් වුවද, පාඨමාලා 9 සඳහාම එකී උපරිමය සම්පූර්ණ වන ලෙස සිසුන් ඇතුළත් කර ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වෙනම පැමිණීමේ ලේඛනයක් පවත්වා තිබුණු අතර, 2015 ඔක්තෝබර් 01 දින සිට 2016 මැයි 01 දින දක්වාම ඔවුන් විසින් දිනපතා පැමිණි වේලාව සටහන් කර තිබුණු නමුත්, පිටවූ වේලාව සටහන් කර නොතිබුණි. ඒ අනුව ඔවුන් රාජකාරී ඉටු කළ කාලය තහවුරු කර ගැනීම විගණනයේදී ගැටළු සහගත විය.

(ආ) බාහිර ආචාර්යවරුන් 06 දෙනෙකු 2016 ජනවාරි සිට මැයි දක්වාම පැමිණි හා පිටවූ වේලාවන් සටහන් කර නොතිබුණි. ඒ අනුව ඔවුන් ඉටු කළ රාජකාරී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) 2015 පෙබරවාරි 16 දින වන විට වාහන දෙකක්, ගොඩනැගිලි හා උපාංග අමාත්‍යාංශය විසින් විද්‍යායතනයට භාර දී තිබුණද, 2016 ජුනි 30 දක්වාම ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

අදාළ කාර්යයයේ ප්‍රමාණය හඳුනා ගැනීමකින් තොරව හා වියදම් ඇස්තමේන්තුවක් රහිතව අවස්ථා 08 කදී එකතුව රු. 105,910 ක අත්තිකාරම් ලබාදීම හේතුවෙන් එම අත්තිකාරම් මුදලින් සියයට 46 සිට සියයට 78 දක්වා ප්‍රතිශතයක් නැවත මුදලින් පියවීමට සිදුවී තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගෘහ පාලනය පිළිබඳ පුහුණු අංශය සඳහා 2015 මාර්තු 17 සිට අප්‍රේල් 27 දක්වා කාලය තුළ ලැබී තිබුණ පිරිවැය රු.480,538 ක් වූ භාණ්ඩ තොගයක් ප්‍රමාණවත් ඉඩකඩ සහිත විද්‍යාගාර පහසුකම් නොලැබීම හේතුවෙන් 2016 මැයි 30 දින වන විටත් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබුණි.

(ආ) මුළුතැන්ගෙයි පුහුණු අංශයට 2015 මාර්තු හා අප්‍රේල් මාසවලදී ලැබී තිබුණු පිරිවැය රු. 1,575,918 ක් වූ භාණ්ඩ සඳහා අවශ්‍ය ආධාරක උපකරණ නොමැතිවීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය තනතුරු 14 ක් හා තාවකාලික ප්‍රදර්ශක තනතුරු 04 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක පුරප්පාඩු පැවතුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඞී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**5.4 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදුවන ඍජු හා වක්‍ර සෞඛ්‍ය පාරිසරික හා සමාජ බලපෑම අවම කරගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිව තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි .

(ආ) දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් ආයතනය තුළ තහනම් කිරීම, මයික්‍රෝන 20 ට වැඩි පොලිතීන් හා අනෙකුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම පාලනය කිරීම හා ප්ලාස්ටික් හා පොලිතීන් වෙනුවට වෙනත් ඇසුරුම් ක්‍රමවේද කෙරෙහි කාර්ය මණ්ඩලය හා සිසුන් දිරි ගැන්වීම වැනි පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විද්‍යායතනයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ප්ලාස්ටික් හා පොලිතීන් මලු විවෘත දහනයෙන් තොරව, ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන වලට යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ අවධානයට යොමු කරවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛන සකස් කර නොතිබීම, ඉඩම හා ගොඩනැගිලි සංකීර්ණයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හා වත්කම් නිෂ්ක්‍රීයව තබා ගැනීම. |
| (ආ) | අත්තිකාරම් | අවශ්‍යතාවය ඉක්මවා අත්තිකාරම් මුදල් ලබාදීම හා අප්‍රමාදව නොපියවීම. |
| (ඇ) | වාහන උපයෝජනය | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකිරීම, ලොග් සටහන් පොත් පවත්වා නොතිබීම, දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සම්පූර්ණ කර විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන නොකිරීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා නොතිබීම. |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලවල පැවැති පුරප්පාඩු පුරවා නොතිබීම හා පැමිණීමේ ලේඛන නඩත්තු නොකිරීම. |